www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා පාලනාධිකාරය චීනය සමග වෙළඳ ආතතීන් අවුලුවාලයි

## Obama administration stokes up trade tensions with China

**2009 ජනවාරි 24**

නව එක්සත් ජනපද පරිපාලනයට යාන්තම් දින දෙකක් ගතවන විට, ජනාධිපති ඔබාමා පත්කල භාන්ඩාගාර ලේකම් චීනයට එරෙහිව පූර්ව අනතුරු ඇඟවීමක් ලෙස පෙනී යන වෙළඳ තහංචි පැනවීමේ නිශ්චිත හා ප්‍රකෝපකාරී තර්ජනයක් නිකුත්කර තිබේ. දැනට නිව් යෝර්ක් මහ බැංකුවේ සභාපති වන ටිමෝති ගේත්නර්, භාන්ඩාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ලැබූ පත්වීම සලකා බලමින් සිටින සෙනේට් සභාවේ මූල්‍ය කමිටුව වෙත 22 වන දින ඉදිරිපත් කල ලිඛිත ප්‍රකාශයකින්, චීනය සිය මුදල ''සංචාලනය''(තම වාසියට හරවාගැනීම) කරන බවට චෝදනා නැඟීය.

කමිටුව පසුව සිය ඡන්දයෙන් ඔහුගේ පත්වීම නිර්දේශ කර ජනවාරි 26 වන දින රැස්වීමට නියමිත සෙනේට් සභාවේ පූර්න සැසිවාරයකට අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත. ගේත්නර් නිර්දේශ කිරීමට කමිටුවේ ඩිමොක්‍රටිකයන් දහදෙනා සමඟ රිපබ්ලිකානුවන් පස්දෙනා ද පෙලගැසී සිටිති.

රෙන්මින්බි යන චීන මුදල කෙරෙහි එක්සත් ජනපද ප්‍රතිපත්තිය විමසමින් නිව් යෝර්ක් සෙනේට් සභික චාල්ස් ෂුමර් හා මිචිගන් සෙනේට් සභික ඩෙබී ස්ටැබිනෝව් විසින් නඟන ලද ප්‍රශ්න වලට ප්‍රතිචාර වශයෙන් ඉදිරිපත්කොට ඇති ගේත්නර්ගේ ලිඛිත ප්‍රකාශය, චීනය කෙරෙහි බුෂ් පරිපාලනයට වඩා ආක්‍රමනකාරී හා ගැටුම්කාරී ප්‍රතිපත්තියක් නව පරිපාලනය විසින් ගැනීමට නියමිත බව සලකුනු කරයි. ''සංචාලනය'' යන ඔහුගේ යෙදුම විශේෂයෙන්ම චීන ආන්ඩුවට එරෙහිව ප්‍රකෝපකාරී ලෙස ගනන් බලා භාවිතා කරන ලද්දකි. මක්නිසා ද යත් 1988 වෙළඳ නීතිය යටතේ භාන්ඩාගාර දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය ප්‍රශ්න පිලිබඳව ශරත් සමය වන විට කොන්ග්‍රසයට වාර්තාවක් ඉදිරිපත් කල යුතු අතර එහිදී රටක් මූල්‍ය ''සංචාලකයෙක්'' ලෙස නිල වශයෙන් නම් කිරීම මඟින්, දඬුවම් තීරු බදු ද, අනෙකුත් වෙළඳ හා මූල්‍ය ප්‍රතිප්‍රහාරයන්ට තුඩුදිය හැකි ආක්‍රමනකාරී රාජ්‍යතාන්ත්‍රික පියවර ද, ගැනීමට ඉඩ සලසන බැවින්ය.

චීන අපනයනයන්ගේ මිල ඉහල නැංවීම මඟින් එක්සත් ජනපද භාන්ඩ සමඟ ඒවායේ තරඟකාරී ශක්තිය පහත හෙලීමට හැකිවන පරිදි රෙන්මින්බි මුදලේ අගය තියුනු ලෙස ඉහල නැංවීම සඳහා බීජිනයට බලකරන වෙළඳ සම්බාධක ද ඇතුලු වඩාත් ආක්‍රමනික පියවර ගන්නා ලෙස එක්සත් ජනපද නිෂ්පාදකයන් හා වෘත්තීය සමිති වලින් එල්ලවූ බලපෑමට ප්‍රතිරෝධය දක්වමින් බුෂ් පරිපාලනය හා භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන්, රෙන්මින්බි අගය තවදුරටත් ඉහල දැමීමට චීනය තල්ලුකර ගැනීමෙහිලා යෙදී සිටි වෙහෙසකර උත්සාහය තුලදී ''සංචාලනය'' යන යෙදුම භාවිතා කිරීමෙන් වැලකී සිටියහ.

එක්සත් ජනපද ඩොලරයට ගැටගසා තිබූ චීන මුදල 2005 දී ඉන් මුදාහල තැන් පටන්, ඩොලරයට සාපේක්ෂව රෙන්මින්බි සියයට 20 න් පමන අධිප්‍රමානය වී තිබෙන අතර, ගෝලීය ආර්ථික පසුබෑම චීන අපනයන්යට බලපෑමට පටන් ගැනීමත්, සමස්තයක් ලෙස ආර්ථිකයේ හැකිලීමත් සමඟ, මෑත සති වලදී සුලු වශයෙන් අවප්‍රමානය වී තිබේ.

ගේත්නර්ගේ ප්‍රකාශනයෙන් සලකුනු කරන නව එදිරිවාදී හඬ, අවසානයේදී දෙවන ලෝක යුද්ධයට තුඩු දුන් 1930 ගනන් වල අවපාතයේ අවධිය තුල අධිකාරය දරන ලද ''අසල්වැසියා හිඟමනට දමනු'' යන වර්ගයේ ප්‍රතිපත්තිවල තර්ජනය පෙන්නුම් කරන්නේ, වේගවත් වන එක්සත් ජනපද හා ගෝලිය පසුබෑම මඟින් අවුලුවා ලන වැඩෙන ආරක්ෂනවාදී ප්‍රවනතාවන්ගේ පෙර නිමිති ය.

ගේත්නර්ගේ ප්‍රකාශනය කඩාපාත් වූයේ එක්සත් ජනපදයේ පියවරයන්ට එරෙහිව චීනය, එක්සත් ජනපද ආන්ඩුවේ නයකර මිලට ගැනිම් කපා හැරීම මඟින් එරටට සිය මුදල යලි අගැයීමට බලකෙරෙන, පෙරලා පහර දීමකට යනු ඇති බවට ආයෝජකයන් අතර පැවති භීතිය කියා පාමින් ඇමරිකානු භාන්ඩාගාර බිල්පත් මිල පහත වැටීමට මඟ පෑදූ මූල්‍ය වෙළඳපොලවල කම්පනයක් ලෙසය. එක්සත් ජනපද ආර්ථිකය රඳා ඇත්තේ, එහි දැවැන්ත වෙළඳ හා ජංගම ගිනුම් වල හිඟයන්ගේ පසුබිම යටතේ සිය මූල්‍ය කටයුතු තිරසාර කර ගැනීමේදී, භාන්ඩාගාර බිල්පත් හා පොරොන්දු නෝට්ටු මිලට ගැනීමේ රූපයෙන් චීනයෙන් ගලා එන ඉමහත් ප්‍රාග්ධනය මතය.

මූල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කල සිය වාර්තාව තුල ගේත්නර් මෙසේ ලිවීය. ''පුලුල් පරාසයක

අර්ථශාස්ත්‍රඥයන්ගේ නිගමනවලින් පිටුබලය ලබමින් ජනාධිපති ඔබාමා, විශ්වාස කරන්නේ චීනය එරට මුදල සංචාලනය කරන බවය. '' මූල්‍ය සංචාලනය තීරනය කිරීම සඳහාත්, චීනය වැනි රටවල් සාධාරන වෙළඳ ප්‍රතිපත්ති වලට මඟ ඇහිරීම් වස් නිදහස් බල පත්‍රයක් සහිතව දිගටම කටයුතු කිරීම වලක්වීම සඳහාත්, එක්සත් ජනපදයේ මැදිහත්වීම ශක්තිමත් කරන නව නීති රෙගුලාසි වෙනුවෙන්''සෙනේට් සභිකයෙකු වශයෙන් ඔබාමා සහයෝගය දී ඇති බව ද, ඔබාමා තමන් සතුව ඇති සියලු රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමෝපායන් චීනයේ මූල්‍ය සංචාලනයන් වෙනස් කිරීම සඳහා තදින්ම භාවිතයට ගන්නා බව ද ප්‍රකාශනය තව දුරටත් සඳහන් කරයි.

එක් අවස්ථාවකදී චීනය, සිය මුදල යලි අගය නොකලහොත් ඊට එරෙහිව දඬුවම් තීරුබදු පැනවිය යුතු යයි නීතියක් කෙටුම්පත් කිරීමට සම්බන්ඳවූ සෙනේට් සභික ෂුමර්, ගේත්නර්ගේ ප්‍රකාශනය වර්නනා කලේය. ඔහු *නිව් යෝර්ක් ටයිම්ස් පත්‍රයට* මෙසේ අදහස් දැක්වීය. ''පලමු දෙදින සම්බන්ධයෙන් ගත් විට මෙය විශාල ඉදිරි පියවරකි.'' ගේත්නර්ට ප්‍රතිචාර දැක්වූ, එක්සත් මෝටර් කාර්මික සංගම් නිලධරයේ හිතවතෙකු වන ඩෙබී ස්ටැබිනොව් නම් අනෙක් සෙනේට් සභිකයා ද, එවකට සෙනේට් සභිකයෙකු වූ ඔබාමා විසින් සම අනුග්‍රාහකත්වය දැක්වූ චීනයට එරෙහිව වෙළඳ යුද්ධයට තුඩු දෙන නීතියක් ගෙන ආ අයෙකි.

චීනයට එරෙහි ගේත්නර්ගේ තර්ජනය වනාහි, නව පරිපාලනයේ ප්‍රතිපත්තිය පිලිබඳව මනා අවබෝධයක් සහිතව සිතාබලා එල්ල කල ප්‍රකාශනයක් බව ජාත්‍යන්තර වෙළඳ හා මූල්‍ය ක්ෂේත්‍රයේ ඔහු සතු දීර්ඝ අත්දැකීම් මඟින් සනිටුහන් කරයි. නිව් යෝර්ක්හි ෆෙඩරල් මහ බැංකුවේ සභාපති ලෙස පත්වීමට පෙර ගේත්නර් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්ති අධ්‍යක්ෂකව සිටියේය. ඊටත් පෙර ඔහු 1990 ගනන් අවසානයේ පැන නැඟි ආසියානු මූල්‍ය අර්බුදය කලමනාකරනය කල ප්‍රමුඛ පුද්ගලයා වශයෙන්, ක්ලින්ටන් පරිපාලනයේ ජාත්‍යන්තර කටයුතු පිලිබඳ නියෝජ්‍ය ලේකම් වශයෙන් ද, එක්සත් ජනපදයේ ජපාන භාන්ඩාගාර නියෝජිතයා වශයෙන් ද ක්‍රියාකලේය. *ටයිම්ස්* පත්‍රය සටහන් කලේ ඔහුගේම විස්තරය අනුව ''ගේත්නර් මහතා මූල්‍ය හුවමාරු අනුපාතික හා මූල්‍ය ප්‍රතිපත්ති පිලිබඳ කටයුතුවල විශේෂඥයෙකි.''

තවද, ගේත්නර්ගේ ප්‍රකාශනය පෙන්නුම් කරන්නේ ජනාධිපතිගේම ආස්ථානය බව සනාථ කිරීමට ඔබාමා පරිපාලනය කඩිනම් විය. නම හෙලි නොකල පරිපාලනයේ නිලධාරියෙකුගේ ප්‍රකාශයක් *ටයිම්ස්* පත්‍රය මෙසේ උපුටා දැක්වීය. ගේත්නර් ''පුනරුච්ඡාරනය කර ඇත්තේ ඔබාමා මහතා මැතිවරන ව්‍යාපරය තුල කී දේම ය.'' මූල්‍ය ප්‍රශ්නය සමඟ පොරබැදීම සඳහා ජනාධිපති '' තමා සතු සියලු රාජ්‍යතාන්ත්‍රික ක්‍රමෝපායන් උපයෝගී කරගැනීමට'' අදහස් කරයි.

පරිපාලනයේ ප්‍රකාශනයන්හි නොබැරෑරුම් හා ප්‍රකෝපකාරී හඬ, චීනයට එරෙහිව දැඩි වෙළඳ පිලිවෙත් සඳහා දිගු කලක් තිස්සේ බලපෑම් කිරීමේ යෙදී සිටි ජාතික කර්මාන්තකරුවන්ගේ සංගමයෙහි සාමාජිකයන් තුල පවා ප්‍රකට ලෙස පෙනෙන තිගැස්මක් ඇතිකර තිබේ. සංගමයේ ජාත්‍යන්තර ආර්ථික කටයුතු පිලිබඳ උප සභාපති ෆ්‍රෑන්ක් වාගෝ *නිව් යෝර්ක් ටයිම්ස්* වෙත පැවසුවේ ''මූල්‍ය අර්බුදය සමඟ ලෝකය බෙහෙවින් වෙනස්ව තිබෙන අතර එක්සත් ජනපද භාන්ඩාගාරය සමඟ චීනයට බොහෝ සම්බන්ධකම් ඇති බව සැලකිය යුතුය. මෙය කල යුතුව ඇත්තේ සාමුහිකව මිස විසංවාදී ක්‍රම වලින් නොවේ.''

23 වන දින චීනය ගේත්නර්ගේ ප්‍රකාශනයට කෝපයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීය. චීන වෙළඳ අමාත්‍යාංශය උපුටා දක්වමින් ඒජන්සි ෆ්‍රාන්ස් ප්‍රෙසි මෙසේ වාර්තා කලාය. බීජිනය '' ජාත්‍යන්තර වෙළඳාමේදී වාසි ලබා ගැනිම පිනිස ඊනියා මූල්‍ය සංචාලනයන් කිසි විටෙකත් යොදාගෙන නැත. හුවමාරු අනුපාතික ප්‍රශ්නය මත චීනයට අභූත චෝදනා නැඟීම උපකාර වන්නේ එක්සත් ජනපද ආරක්ෂනවාදයට පමනි. ප්‍රශ්නයට සැබෑ විසඳුමක් සොයාගැනීමට එයින් පිටිවහලක් නොලැබේ.''

නව පරිපාලනය පිහිටවූ ප්‍රථම දිනයන්හිම චිනය සමඟ ගැටුමක් ඇද ගැනීම වනාහි එලඹීමට ඇති දේ පිලිබඳ ඇඟවුමකි. එක්සත් ජනපදය මාධ්‍ය කරගත් ගැඹුරුවන ලෝක ආර්ථික අර්බුදය මඟින්, ඔබාමා පාලනාධිකාරය එහි පූර්වගාමියාට නොඅඩු ලෙස නියෝජනය කරන ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආක්‍රමනකාරී ජාතිකවාදී හා මිලිටරිවාදී ප්‍රවනතා උත්සන්න කරනවා පමනි.

**බැරී ග්‍රේ**

.

.

© www.wsws.org